# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,406 - 2024 ඔක්තෝබර් මස 11 වැනි සිකුරාදා - 2024.10.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2504 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2520 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ඔක්තෝබර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2501- B 82617 — 5,403 (2024/10)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අධිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කෙටිකාලීන අධිකාරිය සහ ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීමේ නිලධාරී/නිලධාරිනි පුරප්පාඩු - 2024

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කෙටිකාලීන අධිකාරිය සහ ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීමේ නිලධාරී/නිලධාරිනි පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා දක්වා ඇති පරිදි පිරිමි/කාන්තා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

නිත්‍ය නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීම/කෙටිකාලීන අධිකාරිය සඳහා ඉඳුරාම බඳවා ගැනීම (වසර 05ක සේවා කාලයක් සඳහා)

අ. විධායක අංශය
ආ. සාගරික ඉංජිනේරු
ඇ. නැව්බඳ ඉංජිනේරු අංශය
ඈ. මෝටර් රථ ඉංජිනේරු
ඉ. සැපයුම් අංශය
ඊ. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය
උ. සිවිල් ඉංජිනේරු අංශය
ඌ. දන්ත වෛද්‍ය අංශය
එ. තොරතුරු තාක්ෂණ අංශය

නිත්‍ය නාවික හමුදාවේ කෙටිකාලීන අධිකාරිය සඳහා ඉඳුරාම බඳවා ගැනීම (වසර 05ක සේවා කාලයක් සඳහා)

ඒ. වෛද්‍ය අංශය (ක්ෂුද්‍රජීවී විශේෂඥ වෛද්‍ය)

ඉඳුරාම බඳවා ගැනීම :

| | | |
|---|---|---|
| ඔ. | පරිපාලන නිලධාරී සෞඛ්‍ය | (නිත්‍ය නාවික හමුදාව) |
| ඕ. | තූර්ය වාදක අංශය සංගීත | (නිත්‍ය නාවික හමුදාව) |
| ක. | විධායක අංශය | (ස්වේච්ඡා නාවික හමුදාව) |
| ඛ. | පශු වෛද්‍ය නිලධාරී | (ස්වේච්ඡා නාවික හමුදාව) |
| ග. | ගිණුම්කරණ නිලධාරී | (ස්වේච්ඡා නාවික හමුදාව) |
| ඝ. | පර්යේෂණ හා සංවර්ධන නිලධාරී | (ස්වේච්ඡා නාවික හමුදාව) |
| ච. | තොරතුරු තාක්ෂණ අංශය | (ස්වේච්ඡා නාවික හමුදාව) |

3. **මූලික අධ්‍යාපන සුදුසුකම්;**

අ.පො.ස. (සා/ පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයයන්වලට සම්මාන (C) සාමාර්ථයන් සමග ගණිතය විෂය ඇතුළත්ව විෂයයන් 06ක් සමත් ව තිබීම ;

*හෝ*

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථයක් සමග ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයයන් 06ක් සමත් වී තිබීම හා ඉංග්‍රීසි විෂය සම්බන්ධව ඩිප්ලෝමාවක් ලබා තිබීම.

4. උසස් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් ;

අ. **විධායක අංශය :**

නිලය - උප ලුතිනන් (පිරිමි අපේක්ෂකයින් පමණි)

අධ්‍යාපන සුදුසුකම් - භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යා විෂයය ධාරාව යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත්ව තිබීම.

ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යා අංශයෙන් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතුය.

ආ. **සාගරික ඉංජිනේරු අංශය :**

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් සාගරික හෝ යාන්ත්‍රික ඉංජිනේරු විෂයය පිළිබඳ සිව්වසරක පූර්ණ කාලීන උපාධියක් ලබාතිබීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඇ. **නැව්බඳ ඉංජිනේරු අංශය :**

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් යාන්ත්‍රික ඉංජිනේරු හෝ නාවික නිර්මාණ ශිල්පය පිළිබඳ සිව්වසරක පූර්ණ කාලීන උපාධියක් ලබාතිබීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඈ. **මෝටර් රථ ඉංජිනේරු අංශය :**

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් සිව් වසරක පූර්ණ කාලීන යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඉ. **සැපයුම් අංශය :**

නිලය - උප ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ, ගිණුම්කරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, දේපළ පරිපාලනය හා තක්සේරු විෂයයන් පිළිබඳ විශේෂ උපාධියක් ලබාතිබීම.

වයස - අවුරුදු 30ට අඩු විය යුතුය.

ඊ. **විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය :**

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විදුලි, විද්‍යුත් හෝ විදුලි සංදේශන පිළිබඳ සිව්වසරක පූර්ණ කාලීන උපාධියක් ලබා තිබීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) පූර්ණ සාමාජිකත්වය/ආශ්‍රිත සාමාජිකත්වය ලබාතිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

උ. **සිවිල් ඉංජිනේරු අංශය :**

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් සිව්වසරක පූර්ණ කාලීන සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) පූර්ණ සාමාජිකත්වය/ආශ්‍රිත සාමාජිකත්වය ලබාතිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඌ. **දන්ත වෛද්‍ය අංශය :**

නිලය - වෛද්‍ය ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය (BDS) හදරා තිබීම *හෝ* ඊට සමාන සුදුසුකමක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම.

වයස - අවුරුදු 35ට අඩු විය යුතුය.

එ. **තොරතුරු තාක්ෂණ අංශය :**

(1) නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - අ. පො. ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සහිතව සමත් වී තිබීම සහ අ. පො. ස. (උ. පෙළ) විභාගය සමත් වී තිබීම.

අන්තර්ජාතිකව පිළිගත් Red hat සුදුසුකම්ලාභියෙකු, Sun Solaris සහතිකපත්ලාභියෙකු හෝ සහතිකපත් ලාභී Ethical Hacker වරයෙකු විය යුතුය.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

(2) නිලය - **උප ලුතිනන් (පිරිමි/කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් ආයතනයකින් වසර තුනක (03) පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබාතිබීම;

*හෝ*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කරන ලද පිළිගත් ආයතනයකින් ලබාගත් ඒ හා සමාන සුදුසුකම් තිබීම;

පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණික අංශයේ මෘදුකාංග ඉංජිනේරු, දෘඩාංග ඉංජිනේරු, දත්ත පරිපාලක, ජාල පරිපාලක හෝ තොරතුරු තාක්ෂණික කථිකාචාර්යවරයකු ලෙස හෝ තොරතුරු තාක්ෂණ අංශයේ නාවික හමුදාධිපතිතුමාගේ සෑහීමට පත්වන අයුරින් අවම වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

(3) නිලය - **ලුතිනන් (පිරිමි/කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් ආයතනයක පරිගණක විද්‍යාව හෝ දත්ත විද්‍යාව පිළිබඳ තොරතුරු තාක්ෂණික විශේෂඥ හෝ යාන්ත්‍රික ඉගෙන්වීම පිළිබඳ සිව්වසරක ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

දත්ත විද්‍යාව හෝ යාන්ත්‍රික ඉගෙන්වීම සම්බන්ධව වසර දෙකක (02) අවම සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතුය.

ඒ. **වෛද්‍ය අංශය (ක්ෂුද්‍රජීවී විශේෂඥ වෛද්‍ය) - කෙටිකාලීන අධිකාරිය (නිත්‍ය නාවික හමුදාව) :**

නිලය - වෛද්‍ය කොමාණ්ඩර් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ක්ෂුද්‍රජීවී විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මණ්ඩලීය සහතිකය ලබා තිබීම.

වයස - අවුරුදු 42 හෝ ඊට අඩු විය යුතුය.

ඔ. **පරිපාලන නිලධාරි සෞඛ්‍ය (නිත්‍ය නාවික හමුදාව)**

(1) නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෙද හෝ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.

වයස : අවුරුදු 32 ට අඩු විය යුතුය

(2) නිලය - උප ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෙද හෝ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් හදාරා තිබීම සහ රෝහල් හෝ වෛද්‍ය ක්ෂේත්‍රයේ අවම වසරක් හෝ ඊට වැඩි සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වයස - අවුරුදු 32 ට අඩු විය යුතුය.

ඕ. **තූර්ය වාදක අංශය - සංගීත**

(1) නිලය - උප ලුතිනන් (පිරිමි අපේක්ෂකයින් පමණි)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත විෂයය පිළිබඳ ප්‍රාසාංගික කලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සංගීත විෂයය පිළිබඳ ලලිත කලාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත විෂයය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

අමතර සුදුසුකම් සහ ප්‍රායෝගික පරීක්ෂණ - බටහිර/ඉන්දියානු සංගීත විෂයය පිළිබඳ හදාරා ඇති වෙනත් පාඨමාලා.
අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෙනත් ජයග්‍රහණ.
ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සංගීත වැඩසටහන් සඳහා සහභාගී වී තිබීම සහ ලබා ඇති ජයග්‍රහණ.

නාවික හමුදා තූර්ය වාදක කණ්ඩායම විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සාර්ථකව නිම කිරීමෙන් පසු සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවාගනු ලැබේ. සියලුම අයදුම්කරුවන් විසින් සුදුසුකම් ලැබීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.

වයස - අවුරුදු 26 ට අඩු විය යුතුය.

(2) නිලය - වැඩ බලන ලුතිනන් (පිරිමි අපේක්ෂකයින් පමණි)

අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත විෂය පිළිබඳ ප්‍රසාංගික කලාවේදී විශේෂ උපාධිය පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත විෂය පිළිබඳ ලලිත කලාවේදී විශේෂ උපාධිය පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබිම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC ) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංගීත විෂය පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය පළමු පෙළ පන්ති සාමාර්ථයක් සහිතව ලබා තිබීම.

අමතර සුදුසුකම සහ ප්‍රායෝගික පරීක්ෂණ - බටහිර/ඉන්දියානු සංගීත විෂය පිළිබඳ හදාරා ඇති වෙනත් පාඨමාලා.

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෙනත් ජයග්‍රහණ.

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සංගීත වැඩසටහන් සඳහා සහභාගී වී තිබීම සහ ලබා ඇති ජයග්‍රහණ.

නාවික හමුදා තූර්ය වාදක කණ්ඩායම විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය සාර්ථකව නිම කිරීමෙන් පසු සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. සියලුම අයදුම්කරුවන් විසින් සුදුසුකම් ලැබීමේ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.

වයස - අවුරුදු 26 ට අඩු විය යුතුය.

ක. **විධායක අංශය** - **(ස්වේච්ඡා නාවික හමුදාව)**
නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම;
වයස - අවුරුදු 30 ට අඩු විය යුතුය.

ඛ. **පශු වෛද්‍ය අංශය** - **(ස්වේච්ඡා නාවික හමුදාව)**
නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)
අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් පශු වෛද්‍ය විද්‍යාව (BVSc) සම්බන්ධව උපාධියක් ලබා තිබීම;

*සහ*

ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ස්ථිර සාමාජිකත්වය ලබා තිබීම;

වයස - අවුරුදු 35 ට අඩු විය යුතුය.

ග. **ගිණුම්කරන නිලධාරි** - **(ස්වේච්ඡා නාවික හමුදාව)**

නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ගිණුම්කරණය විෂයයක් වශයෙන් හදාරා තිබීම;

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමත විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණ විෂයයක් වශයෙන් ඇතුලත් වූ උපාධියක් ලබා තිබීම;

වයස - වයස අවුරුදු 30 ට අඩු විය යුතුය.

ඝ. **පර්යේෂණ හා සංවර්ධන (ස්වේච්ඡා)**
(පර්යේෂණ හා සංවර්ධන - යාන්ත්‍රික) ඉංජිනේරු නිලධාරි (ස්වේච්ඡා)

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමැතියලත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (BSc Eng. (Hons)) ලබා තිබීම;

අදාළ ක්ෂේත්‍රයේ ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

තාක්ෂණික කුසලතා - යාන්ත්‍රික කොටස්/පද්ධති සැලසුම් (design) කිරීම සහ ආකෘති නිර්මාණ (modeling) සඳහා CAD මෘදුකාංගවල (Solid Work, Auto CAD) ප්‍රවීණත්වය;

Material Science පිළිබඳ අවබෝධය සහ විවිධ යෙදුම් සඳහා ඒවා තෝරා ගැනීමේ හැකියාව;

Finite Element Analysis (FEA) හි ප්‍රවීණත්වය සහ පරිගණක තරල ගතික (Computer Fluid Dynamics) සමාකෘති පිළිබඳ ප්‍රවීණත්වය;

යාන්ත්‍රික පරීක්ෂණ ක්‍රම සහ එම උපකරණ පිළිබඳ අවබෝධය.

පර්යේෂණ හා නවෝත්පාදන - යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නවෝත්පාද සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම සහ ඒ ආශ්‍රිත ගැටලු විසඳීමට ඇති හැකියාව;
නව යාන්ත්‍රික සැලසුම් හා සංකල්ප ගොඩනැගීමට සහ මූලාකෘති ගොඩනැගීමට ඇති හැකියාව.

මූලාකෘති ගොඩනැගීම සහ පරීක්ෂා කිරීම - ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍ර (3D Printers) යන්ත්‍ර සහ පරීක්ෂණ උපකරණ ඇතුලු මූලාකෘති මෙවලම් සහ උපකරණ භාවිතය පිළිබඳ අත්දැකීම;

යාන්ත්‍රික අත්හදා බැලීම සැලසුම් කිරීම සහ පැවැත්වීමේ හැකියාව;

වයස - වයස අවුරුදු 21 ත් 41 ත් අතර විය යුතුය.

**පර්යේෂණ හා සංවර්ධන - යාන්ත්‍රික ඉංජිනේරු නිලධාරි (ස්වේච්ඡා)**

නිලය - ලුතිනන් කොමාණ්ඩර් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමැතියලත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (MSc Eng) *හෝ* දර්ශනපති උපාධිය (MPhil) ලබා තිබීම;

අදාළ ක්ෂේත්‍රයේ ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

තාක්ෂණික කුසලතා - යාන්ත්‍රික කොටස්/ පද්ධති සැලසුම් (design) කිරීම සහ ආකෘති නිර්මාණ (modeling) සඳහා CAD මෘදුකාංගවල (Solid Work, Auto CAD) ප්‍රවීණත්වය;

Material Science පිළිබඳ අවබෝධය සහ විවිධ යෙදුම් සඳහා ඒවා තෝරා ගැනීමේ හැකියාව;

Finite Element Analysis (FEA) හි ප්‍රවීණත්වය සහ පරිගණක තරල ගතික (Computer Fluid Dynamics) සමාකෘති පිළිබඳ ප්‍රවීණත්වය;

යාන්ත්‍රික පරීක්ෂණ ක්‍රම සහ එම උපකරණ පිළිබඳ අවබෝධය.

පර්යේෂණ හා නවෝත්පාදන - යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ නවෝත්පාදන සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම සහ ඒ ආශ්‍රිත ගැටලු විසඳීමට ඇති හැකියාව;
නව යාන්ත්‍රික සැලසුම් හා සංකල්ප ගොඩනැගීමට සහ මූලාකෘති ගොඩනැගීමට ඇති හැකියාව.

මූලාකෘති ගොඩනැගීම සහ පරීක්ෂා කිරීම - ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍ර (3D Printers) යන්ත්‍ර සහ පරීක්ෂණ උපකරණ ඇතුළු මූලාකෘති මෙවලම් සහ උපකරණ භාවිතය පිළිබඳ අත්දැකීම;

යාන්ත්‍රික අත්හදා බැලීම සැලසුම් කිරීම සහ පැවැත්වීමේ හැකියාව.

වයස - වයස අවුරුදු 21 ත් 41 ත් අතර විය යුතුය.

පර්යේෂණ හා සංවර්ධන නිලධාරි - Mechatronics ඉංජිනේරු (ස්වේච්ඡා)

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමත විශ්වවිද්‍යාලයකින් ලබා ගත් Mechatronics ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (BSc Eng (Hons) ලබා තිබීම;

අදාළ ක්ෂේත්‍රයේ ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

තාක්ෂණික කුසලතා - යාන්ත්‍රික උපාංග, ඉලෙක්ට්‍රොනික උපකරණ, පාලන ඇල්ගොරිතම (Control Algorithm) සහ මෘදුකාංග ඒකාබද්ධ කරන Mechatronic පද්ධති නිර්මාණය කළ හැකි වීම;

පාලන ඇල්ගොරිතම (Control Algorithm) නිර්මාණය සඳහා, Python, CIC ++ හෝ Java වැනි පරිගණක මෘදුකාංගවල ප්‍රවීණත්වය;

Embedded System නිර්මාණය සඳහා Microcontroller සහ කේත FPGA ලිවීමේ ප්‍රවීණත්වය;

C/C ++, VHDL හෝ Verilog වැනි පරිගණක භාෂා පිළිබඳ ප්‍රවීණත්වය;

Open CV, Tensor Flow හෝ Pytoreh වැනි Computer Vision Libraries සහ Frame Works භාවිතා කිරීමේ ප්‍රවීණත්වය.

පර්යේෂණ සහ නවෝත්පාදන - Mechatronic හෝ රොබෝ ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයේ නවෝත්පාදන සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම සහ ගැටළු විසඳීමේ ඇති හැකියාව;

නව Mechatronics සැලසුම් හා සංකල්ප ගොඩනැගීම සහ මූලාකෘති ගොඩනැගීමට ඇති හැකියාව;

මූලාකෘති ගොඩනැගීම සහ පරීක්ෂා කිරීම - ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍ර (3D Printers) ඇතුලුව මූලාකෘති මෙවලම් හා උපකරණ හැසිරවීම සම්බන්ධ අත්දැකීම;

Mechatronic පරීක්ෂණ/අත්හදාබැලීම සිදු කිරීමේ හැකියාව;

වයස - වයස අවුරුද 21 ත් 41 ත් අතර විය යුතුය.

පර්යේෂණ හා සංවර්ධන නිලධාරි - Mechatronics ඉංජිනේරු (ස්වේච්ඡා)

නිලය - ලුතිනන් කොමාණ්ඩර් (පිරිමි/කාන්තා)

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමත විශ්වවිද්‍යාලයකින් ලබා ගත් Mechatronics ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (MSc Eng) හෝ දර්ශනපති උපාධිය (MPhil) ලබා තිබීම;
අදාළ ක්ෂේත්‍රයේ ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ;

තාක්ෂණික කුසලතා - යාන්ත්‍රික උපාංග, ඉලෙක්ට්‍රොනික උපකරණ, පාලන ඇල්ගොරිතම (Control Algorithm) සහ මෘදුකාංග ඒකාබද්ධ කරන Mechatronic පද්ධති නිර්මාණය කළ හැකි වීම;

පාලන ඇල්ගොරිතම (Control Algorithm) නිර්මාණය සඳහා, Python, CIC ++ හෝ Java වැනි පරිගණක මෘදුකාංගවල ප්‍රවීණත්වය.

Embedded System නිර්මාණය සඳහා Microcontroller සහ FPGA කේත ලිවීමේ ප්‍රවීණත්වය;

C/C ++, VHDL හෝ Verilog වැනි පරිගණක භාෂා පිළිබඳ ප්‍රවීණත්වය;

Open CV, Tensor Flow හෝ Pytoreh වැනි Computer Vision Libraries සහ Frame Works භාවිතා කිරීමේ ප්‍රවීණත්වය.

පර්යේෂණ සහ නවෝත්පාදන - Mechatronic හෝ රොබෝ ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයේ නවෝත්පාදන සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම සහ ගැටළු විසඳීමේ ඇති හැකියාව;

නව Mechatronics සැලසුම් හා සංකල්ප ගොඩනැගීම සහ මූලාකෘති ගොඩනැගීමට ඇති හැකියාව.

මූලාකෘති ගොඩනැගීම සහ පරීක්ෂා කිරීම - ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍ර (3D Printers) ඇතුලුව මූලාකෘති මෙවලම් හා උපකරණ හැසිරවීම සම්බන්ධ අත්දැකීම;

Mechatronic පරීක්ෂණ/අත්හදාබැලීම සිදු කිරීමේ හැකියාව;

වයස - වයස අවුරුදු 21 ත් 41 ත් අතර විය යුතුය.

ච. තොරතුරු තාක්ෂණ අංශය - Ethical Hacking Officer (ස්වේච්ඡා)

(1) නිලය - ලුතිනන් (පිරිමි අපේක්ෂකයින් පමණි)

අධ්‍යාපන සුදුසුකම - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් ආයතනයකින් සයිබර් ආරක්ෂාව හෝ තොරතුරු ආරක්ෂණ සම්බන්ධ වසර හතරක (04) උපාධියක් ලබා තිබීම.

Ethical Hacking සම්බන්ධයෙන් ලොව පිළිගත් Certified Ethical Hacker (CEH)/ Certified Information Systems Security Professional (CISSP)/ Offensive Security Certified Professional (OSCP/Certified Penetration Testing Engineer (CPTE) යන පාඨමාලා අතුරින් එකක් හෝ සම්පූර්ණ කර තිබීම;

සයිබර් ආරක්ෂණය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ VAPT ඇතුලු අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් ලබා තිබීම;

සයිබර් ආරක්ෂණ ව්‍යාපෘති, වැඩසටහන්, පර්යේෂණයන් සඳහා ඍජුව දායක වී ඇති බව සහ ඒ පිළිබඳ මනා පරිචිතය;

විවිධ තලවල සිටින පුද්ගලයින් සඳහා සයිබර් ආරක්ෂණ විෂයන් සම්බන්ධව පැහැදිලි කිරීමේ ප්‍රවීණතාවය ඇතුළුව විශිෂ්ට වාචික සහ ලිඛිත සන්නිවේදනය සහ අන්තර් පුද්ගල කුසලතා.

විවිධ තත්වයන් තුළ Penetration Tests සහ Vulnerability Assessments සිදු කිරීමේ පළපුරුද්ද.

Ethical Hacking ක්‍රමවේදයන්, Tools සහ Frameworks සම්බන්ධව ඉතා හොඳ දැනුමක් තිබීම.

Network Protocols, Systems Administration, තොරතුරු ආරක්ෂාවේ ඉහල තත්වයේ යෙදවීම් සම්බන්ධව මනා අවබෝධය සහ ප්‍රායෝගිකව භාවිතා කිරීමේ නිපුණත්වය.

පොදු ආරක්ෂක දුර්වලතා (Common Security Vulnerabilities) අවම කිරීමේ ක්‍රම පිළිබඳ මනා අවබෝධයක් තිබීම.

විවිධ මෙහෙයුම් පද්ධති (උදා : Windows, Linux) සම්බන්ධව මනා දැනුමක් තිබීම.

වයසස - අවුරුදු 32ට අඩු විය යුතුය.

(2) නිලය - **ලුතිනන් කොමාණ්ඩර් - Ethical Hacking officer**
**(පිරිමි අපේක්ෂකයින් පමණි)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් සයිබර් ආරක්ෂාව (Cyber Security) හෝ තොරතුරු ආරක්ෂාව (Information Security) සම්බන්ධ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම;

Ethical Hacking සම්බන්ධයෙන් ලොව පිළිගත් Certified Ethical Hacker (CEH)/Certified Information Systems Security Professional (CISSP)/Offensive Security Certified Professional (OSCP)/ Certified Penetration Testing Engineer (CPTE) යන පාඨමාලා අතුරින් එකක් හෝ හදාරා තිබීම;

සයිබර් ආරක්ෂණය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්දක් ලබා තිබීම;

සයිබර් ආරක්ෂණ ව්‍යාපෘති, වැඩසටහන්, පර්යේෂණයන් සඳහා ඍජුව දායක වී ඇති බව සහ ඒ පිළිබඳ මනා පරිචිතය;

විවිධ තලවල සිටින පුද්ගලයින් සඳහා සයිබර් ආරක්ෂණ විෂයන් සම්බන්ධව පැහැදිලි කිරීමේ ප්‍රවීණතාවය ඇතුළුව විශිෂ්ඨ වාචික සහ ලිඛිත සන්නිවේදනය සහ අන්තර් පුද්ගල කුසලතා;

විවිධ තත්වයන් තුළ PenetrationTests සහ Vulnerability Assessments සිදු කිරීමේ පළපුරුද්ද;

Ethical Hacking ක්‍රමවේදයන්, Tools සහ Frameworks සම්බන්ධව ඉතා හොඳ දැනුමක් තිබීම;

Network Protocols, Systems Administration තොරතුරු ආරක්ෂාවේ ඉහළ තත්ත්වයේ යෙදවීම් සම්බන්ධව මනා අවබෝධය සහ ප්‍රායෝගිකව භාවිත කිරීමේ නිපුණත්වය;

පොදු ආරක්ෂක දුර්වලතා (Common Security Vulnerabilities) අවම කිරීමේ ක්‍රම පිළිබඳ මනා අවබෝධයක් තිබීම;

විවිධ මෙහෙයුම් පද්ධති (උදා : Windows, Linux) සම්බන්ධව මනා දැනුමක් තිබීම;

වයස - අවුරුදු 35ට අඩු විය යුතුය.

5. **අනෙකුත් සුදුසුකම් :**

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය;

අ. පුරවැසිභාවය - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

ආ. වයස - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතුය.

ඇ. උස - පිරිමි - අඟල් 66ට නොඅඩු විය යුතුය.
කාන්තා - අඟල් 63ට නොඅඩු විය යුතුය.

ඈ. බර - පිරිමි - කි.ග්‍රෑ. 52ට නොඅඩු විය යුතුය.
කාන්තා - කි.ග්‍රෑ. 41ට නොඅඩු විය යුතුය.

ඉ. පපුව - (පිරිමි) අඟල් 32ට නොඅඩු විය යුතුය.

ඊ. වර්ණ දෘෂ්ඨිය - එස්ටීඩී II (නිසි පෙනුම).

උ. දෘෂ්ඨි තීක්ෂණත්වය - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව)
[වෛද්‍ය, තූර්ය වාදක අංශය සහ සැපයුම් අංශයන් සඳහා පමණක් 6/12 දෘෂ්ඨි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් සලකා බැලිය හැක.]

ඌ. සිවිල් තත්ත්වය - විවාහක/අවිවාහක.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ. තව ද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ.

7. ඉහත සඳහන් 3, 4 සහ 5 ඡේදයන් හි දක්වා ඇති අවශ්‍යතාවයන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සේවා කොන්දේසි;**

අ. අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරි/නිලධාරිනි තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරින්/නිලධාරිනියන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. සියලුම නිලධාරීන්/නිලධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන්පසුව නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා පනත, නාවික හමුදා රෙගුලාසි, නාවික හමුදා නියෝග හා සංදේශ මගින් බලාත්මක කරනු ලබන නීති රීති හා උපදෙස්වලටත් මින් මතුවට පනවනු ලබන නීතිරීති හා උපදෙස්වලට ද යටත් විය යුතුයි.

ඉ. අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් නිලධාරියෙකු/නිලධාරිනියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ නිලධාරියා/නිලධාරිනිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරීන්/නිලධාරිනියන් හට නිලධරි නිවාස තුළින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

ඌ. විවාහක නිලධාරීන්/නිලධාරිනියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

**9. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා;**

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

**10. වැටුප් හා දීමනා;**

2024.01.10 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2024 අනුව වේ.

**ක්ෂුද්‍රජීවී විශේෂඥ වෛද්‍ය නිලධාරි :**

| *විස්තරය* | *ශ්‍රේණිය* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* | *කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|
| මූලික වැටුප | විශේෂ ශ්‍රේණිය | 88,000.00 | 88,000.00 | 88,000.00 |
| ජීවන වියදම් දීමනාව | - | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | - | 525.00 | 525.00 | 525.00 |
| අතුරු දීමනාව | - | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | - | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අතුරු දීමනාව - 2022 | - | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනාව | විශේෂ ශ්‍රේණිය | 70,000.00 | 70,000.00 | 70,000.00 |

| *විස්තරය* | *ශ්‍රේණිය* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* | *කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් සහිත දීමනාව | විශේෂ ශ්‍රේණිය | 3,400.00 | 3,400.00 | 3,400.00 |
| විශේෂ අමතර දීමනාව (වෛද්‍ය නිලධාරින් සඳහා) | විශේෂ ශ්‍රේණිය | 1,500.00 | 1,500.00 | 1,500.00 |
| ආහාර දීමනාව | - | 34,800.00 | 34,800.00 | 34,800.00 |
| | **එකතුව** | **225,025.00** | **225,025.00** | **225,025.00** |

**දන්ත වෛද්‍ය අංශය සඳහා වැටුප :**

| *විස්තරය* | *ශ්‍රේණිය* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|
| මූලික වැටුප | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 52,955.00 | 52,955.00 | 52,955.00 |
| ජීවන වියදම් දීමනාව | - | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | - | 525.00 | 525.00 | 525.00 |
| අතුරු දීමනාව | - | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | - | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අතුරු දීමනාව - 2022 | - | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 70,000.00 | 70,000.00 | 70,000.00 |
| විශ්‍රාම වැටුප් සහිත දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,700.00 | 3,400.00 | 3,400.00 |
| විශ්‍රාම වැටුප් රහිත දීමනාව | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,700.00 | 2,125.00 | 2,125.00 |
| විශේෂ අමතර දීමනාව (දන්ත වෛද්‍ය නිලධාරි) | දන්ත වෛද්‍ය ශ්‍රේණිය II | 1,500.00 | 1,500.00 | 1,500.00 |
| ආහාර දීමනාව | - | 34,800.00 | 34,800.00 | 34,800.00 |
| | **එකතුව** | **189,980.00** | **189,980.00** | **189,980.00** |

**වෛද්‍ය අංශය හා දන්ත වෛද්‍ය අංශය හැර අනෙකුත් සියලු අංශයන් සඳහා වැටුප් :**

| *විස්තරය* | *වැඩබලන උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* | *කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|---|
| මූලික වැටුප | 41,905.00 | 47,615.00 | 55,625.00 | 60,965.00 | 62,595.00 |
| ජීවන වියදම් දීමනාව | 17,800.00 | 17,800.00 | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | 525.00 | 525.00 | 525.00 | 525.00 | 525.00 |
| දුෂ්කර ලැගුම් දීමනාව | 600.00 | 600.00 | 600.00 | 600.00 | 600.00 |

| *විස්තරය* | *වැඩබලන උප ලුතිනන් (රු.)* | *උප ලුතිනන් (රු.)* | *ලුතිනන් (රු.)* | *ලුතිනන් කොමාණ්ඩර් (රු.)* | *කොමාණ්ඩර් (රු.)* |
|---|---|---|---|---|---|
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අමතර විශේෂ දීමනාව | 5,000.00 | 5,000.00 | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| ආහාර දීමනාව | 34,800.00 | 34,800.00 | 34,800.00 | 34,800.00 | 34,800.00 |
| එකතුව | 104,630.00 | 110,340.00 | 118,350.00 | 123,690.00 | 125,320.00 |

11. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමිවන පහසුකම්, දීමනා හා වරප්‍රසාද :

අ. ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරින්/නිලධාරිනියන් සඳහා පමණක් හිමි වේ.

ආ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.

ඇ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඈ. කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට/නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරි නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඉ. නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

ඊ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට)

උ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට/නිලධාරිනියන්ට රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

12. **අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස් :**

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙ හි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිත ව පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. **ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දින වන 2024 නොවැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට** ප්‍රථම ලැබෙන සේ 'ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවාගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ 01' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'ඉදුරාම බඳවා ගැනීම - නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරින්/නිලධාරිනියන්' යනුවෙන් සටහන් කළ යුතුයි. තවද <u>www.navy.lk</u> වෙබ් අඩවියට පිවිසීමෙන් මාර්ගගත ක්‍රමයට යොමු කළ හැකි අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. වැඩි විස්තර දුරකතන අංක 011-7195120/ 011-7195154 මගින් ද ලබාගත හැක.

ආ. රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්) නියුතු අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය;

(2) අයදුම්කර ඇති අංශයට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇතිබව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/උපාධි සහතික;
(3) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය;
(4) මාස 06ක් ඇතුළත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(6) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතුය);
(7) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ/ අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික අස්ථානගත වුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. ඉල්ලුම්පතෙ හි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/ අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිත ව සේවයෙන් පහකිරීමට ද යටත් වේ.

**14. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්‍ෂණ :**

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්‍ෂකයින්/අපේක්‍ෂිකාවන් පළමු සම්මුඛ පරීක්‍ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්‍ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ / අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුව ද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ. මූලික සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා :

| *ඉසව්ව* | *වාර ගණන* | | *කාලය* | |
|---|---|---|---|---|
| | *පිරිමි* | *කාන්තා* | *පිරිමි* | *කාන්තා* |
| මීටර් 1600 දිවීම | - | - | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| push ups | 12 හෝ ඊට වැඩි | 08 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |
| sit ups/Curl ups | 10 හෝ ඊට වැඩි | 07 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය. මෙම වෛද්‍ය පරීක්‍ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනින් ඉදිරි සම්මුඛ පරීක්‍ෂණය සඳහා කැඳවීම් කරනු ලබයි, එම පරීක්ෂණයේ දී ලබාගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවාගනු ලැබේ.

ඈ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඉ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය Whatsapp පණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඊ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත, ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

උ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද, එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේ ය.

ඌ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

15. ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉඳුරාම නිලධාරින්/නිලධාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදුකිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතුවේ.

*සටහන* - මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

යූවීඑම්පී පෙරේරා, ආර්එස්පී**, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කෙටිකාලීන අධිකාරිය සහ ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීමේ නිලධාරි/නිලධාරිනියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන තනතුර :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. විද්‍යුත් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————. (2024 නොවැම්බර් මස 04 වැනි දිනට )

10. උස :————. (අඟල්), පපුව (පිරිමි) :————. (අඟල්), බර :————. (කි.ග්‍රෑ.)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

15. දුරකථන අංකය :————. (Whatsapp) අංකය :————.

16. විවාහක/ අවිවාහක බව :————.

17. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් :————.

19. පාසල සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

21. දෙමව්පියන් පිළිබඳ විස්තර :

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :...............................................................................................
.................................................................................................................

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) : .................................................................................................
..........................................................................................................................

24. පාසලේ/ විශ්වවිද්‍යාලයේ/ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) : .........
..........................................................................................................................
..........................................................................................................................

25. සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බල සේනාවේ/ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය : ..................
........................................................................................................................

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :........................
....................................................................................................................................
....................................................................................................................

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න : ......................................................................................................................
....................................................................................................................................

28. රාජ්‍ය අංශයෙහි දෙපාර්තමේන්තුවක/ මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර/ සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු : :...........
....................................................................................................................................
....................................................................................................................................
.................................................................................................................................

29. *චරිත සහතික පිළිබඳ විස්තර* :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

30. ***අයදුම්කරු/ අයදුම්කාරිනිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය***

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාපිළිවෙල හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරිනියගේ අත්සන.

දිනය :————.

10-109

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### සංශෝධනයයි

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2024

උක්ත විභාගය සඳහා අයදුම්පත් භාරගැනීම 2024.10.07 දින සිට 2024.10.21 තෙක් දින දීර්ඝ කර ඇති බව මෙයින් දන්වමි. අදාළ අයදුම්පත් **2024.10.21** දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර,
විභාග කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 07 වැනි දින,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

10-107

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

සාමය, ගැටුම් කළමණාකරනය සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

(ප්‍රධාන බඳවා ගැනීම - 2024/2025)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ සාමය, ගැටුම් කළමණාකරනය සහ සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, දේශපාලන විද්‍යාව සහ නීතිය යන අංශයෙන්හි අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, අධ්‍යාපන අංශයේ රැකියා නියුක්තිකයන්, සමාජ ක්‍රියාකාරීන් සහ විදේශගත වී සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිස්, ගැටුම් කළමනාකරණය, සහ සාමය ගොඩනැංවීම පිළිබඳව හා සමාජ වැඩ පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

*සුදුසුකම්* .- අ. පො. ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සමාර්ථ 3 ක් සහිතව සමත් වීම; හෝ

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

සම්පූර්ණ අර්ස (Total credits) : 30 කි

*සාමාසික ගණන :* සාමාසික 02 කි.

*ඩිප්ලෝමාවේ ස්වභාවය :* මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

ඉගැන්වීම් ක්‍රමවේදය : සජීවීව සහ L.M.S පද්ධතිය හරහා ඉගැන්වීම් පහසු දිනයක් තුලදී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදු කෙරේ.

*මාධ්‍ය :* සිංහල හෝ ඉංග්‍රීසි

*පාඨමාලා කාලය :* මාස 12 කි

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු.-සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අය කිරීම රු. 36,000.00 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේදී රු. 1000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය. රු. 36,000.00 ක මුදල එකවර හෝ වාරික 12 කින් ගෙවා අවසන් කළ හැකිය.

*පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කළහැකි ලේඛනයක ඡායාරූප (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය) ගුවන් ගමන් බලපත්‍රය)
2. අ. පො. ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්

071-9136683 (WhatsApp) අංකයට යොමු කළ යුතුය.

*පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය :* **2024.11.08 වේ.**

*වැඩි විස්තර සඳහා*.- කාර්යාල වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 081-3169800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

10-95

---

**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ පේටන්ට් පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2024

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පුරප්පාඩුව පවතින ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ පේටන්ට් පරීක්ෂක තනතුරු 10 ක් සඳහා සුදුස්සන් බඳවා ගැනීම පිණිස පහත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අයදුම් කිරීමේ සුදුසුකම් :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි පහත සඳහන් සුදුසුකම් සහිත උපාධිධාරියකු වීම හා
2. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වසර 05කට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත සංවර්ධන නිලධාරීන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාව නොසලකා මේ අවස්ථාවට පමණක් විභාගය සඳහා අයදුම් කළ හැක. (රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග පරිදි)

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී (භෞතික විද්‍යා හෝ ජීව විද්‍යා) උපාධියක් ලබා තිබිය යුතුය;

ii. ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

02. *විභාග කොන්දේසි :*

**2024 දෙසැම්බර් මාසයේ දී** ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ආශ්‍රිත නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුකූලව විභාග කොමසාරිස් ජනරාල් විසින් **කොළඹ දී පමණක්** විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams / E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2024 ඔක්තෝබර් මස 14 දින පෙ. ව. 9.00ට විවෘත වන අතර 2024 නොවැම්බර් මස 13 වැනි දින රාත්‍රී 9.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

03. සේවා කොන්දේසි :-

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද 2022.12.14 දිනැති අංක 2310/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ විධිවිධානවලට හා එම බඳවා ගැනීමේ පටිපාටියට මින් මතු සිදු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත් ව, තෝරාගනු ලබන අයදුම්කරුවන් බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරී III ශ්‍රේණියේ පේටන්ට් පරීක්ෂක තනතුරට පත් කරනු ලැබේ.

I. පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

II. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුවේ. තව ද ඔවුන් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත්කරනු ලබන දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් ව පත්කරනු ලැබේ. පත් කරනු ලබන නිලධාරීන් පරිවාස කාලය අවසානයේ දී තනතුරෙ හි ස්ථිර කිරීම සඳහා වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වියයුතු අතර, පරිවාස කාලය තුළ දී නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

IV. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව හා ඊට අනුෂාංගික රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව සේවයට බැඳී වසර 03ක් තුළ ලබාගත යුතු ය.

V. පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද කාර්ය පටිපාටික රීතිවලට ද රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත්, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

VI. මෙම *ගැසට්* පත්‍රයේ I වැනි කොටසේ (II අ) වැනි ඡේදය ආරම්භයේ පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කෙරේ.

04. වැටුප් පරිමාණය :-

2016.02.25 දිනැති රා. ප. ච. 03/2016 ට අනුව MN - 4 - 2016 හි

රු. 31,490 - 10X445 - 11X660 - 10X730 - 5X750 - රු. 54,250 (මාසික)

වැටුප් පරිමාණය මෙම තනතුරට හිමිය.

05. වයස් සීමාව :-

1. අයදුම්පත් කැඳවීමේ දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ට හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වසර

05කට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත සංවර්ධන නිලධාරීන්ට උපරිම වයස් සීමාව නොසලකා මේ සඳහා අයදුම් කළ හැක.

*06. කායික සුදුසුකම් :*

I. සෑම අයදුම්කරුවකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

*යෝග්‍යතාව :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. 2022.12.14 දිනැති අංක 2310/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල V පරිච්ඡේදයේ සඳහන් එකදු හෝ නුසුදුසුකමකින් යුක්ත නොවිය යුතු ය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

*07. බඳවා ගැනීමේ ක්‍රමය :*

සියලු බඳවා ගැනීම් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරීන් සඳහාවන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට හා රජය විසින් පනවා ඇති චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව සිදු කෙරේ.

තරඟ විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයක ම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින්ගෙන් ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව එම විභාගයෙන් වැඩිම සමත් ලකුණු ලැබූවන්ගෙන් කුසලතා අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*08. විභාගය :*

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විතය.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40 |
| 2. ඉංග්‍රීසි | පැය 02 | 100 | 40 |

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. සෑම අපේක්ෂකයකු ම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුතු ය.

II. අපේක්ෂකයන් විසින් විභාගයට පෙනී සිටීමට ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

III. *විෂය නිර්දේශය :*

*විෂය අංක 01 - සාමාන්‍ය බුද්ධිය*

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයන් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

විෂය අංක 02 - ඉංග්‍රීසි

I. *අවබෝධය*
මෙහි දී වචන 200ට නොවැඩි තෝරාගත් ලිඛිත ඛණ්ඩයක් කියවා අවබෝධ කර පිළිතුරු සැපයීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

II. *ව්‍යාකරණ*
කාලනාම, ක්‍රියා, ඍජු සහ වක්‍ර කථනය, කර්ම කාරක සහ කර්තෘ කාරක වාක්‍ය, ලිංග භේදය, නිපාත ආදී ක්ෂේත්‍රයන් හි සරල අවබෝධය පරීක්ෂා කෙරේ.

*09. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

ව්‍යුහගත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව එම විභාගයෙන් වැඩිම සමත් ලකුණු ලැබූවන්ගෙන් කුසලතා අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකි. සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහා ම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් වත් ලබා නොගන්නා අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එක් එක් අපේක්ෂකයා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 45 | මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% |
| ජාතික වෘත්තීය කුසලතා 05 වන මට්ටම හෝ ඊට ඉහළ (NVQ 5 මට්ටම හෝ ඊට වැඩි) මට්ටමක පරිගණක භාවිතාව පිළිබඳ පුහුණුවක් | 30 | |
| ඉංග්‍රීසි භාෂාව තේරුම් ගැනීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන ආකල්ප හා පෞරුෂය සඳහා | 05 | |

*පත් කරනු ලැබීම සඳහා තෝරා ගැනීමේ ක්‍රමය :*

පත්කරනු ලැබීම සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලබන්නේ **ඉහත 03 යටතේ දක්වා ඇති කරුණුවලට යටත්ව**, විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුව අනුව වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙලින් වේ.

විභාගයට පෙනී සිටීමට අයදුම්කර ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. *විභාගයට අයදුම් කිරීමේ පිළිවෙළ :*

I. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පත භාරගන්නා ලද බව/භාර නොගන්නා බව විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කළ ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. විභාග ගාස්තුව රු. 1,200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදුකරනු නොලැබේ.

11. *විභාග ප්‍රවේශ පත්‍රය :*

I. මෙම නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කර ඇති හා අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට තම අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ්

අඩවියේ පළකරනු ඇත. යම් අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම්, එසේ පළකරනු ලබන දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාරතමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. අයදුම්කරුවන් තමන්ගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම ද විභාග දෙපාර්තමේන්තුවට දැන්විය යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි වන අයුරින් ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුවන්ගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතු වේ.

III. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව :*

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ. සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වනු පිණිස දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය.

එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වනු පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පැවැත්වෙන අතරතුර හෝ ඉන් පසුව කවර හෝ අවස්ථාවක දී වුව ද අයදුම්කරුගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය. අයදුම්කරු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවත් හෝ කිසියම් අදාළ කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව එකී අයදුම්කරුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී හෝ සනාථ වුවහොත්, එයම ඔහු/ ඇය වහාම සේවයෙන් පහ කරනු ලැබීමට හේතු වනු ඇත. තව ද මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා සපුරා නොමැති අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

14. මෙම බඳවා ගැනීමට අදාළ වන සහ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති ඕනෑම කරුණක් පිළිබඳව තීරණයක් ගැනීම ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

**ගීතාංජලී ආර්. රණවක,**
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය.

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ආශ්‍රිත නිලධාරි III ශ්‍රේණියේ පේටන්ට් පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2024

Open Competitive Examination For Recruitment to the Post of Associate Officers Grade III Patent Examiner in the National Intellectual Property Office of Sri Lanka - 2024

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

01. නම :
1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :————.

02. ලිපිනය :
පෞද්ගලික :————.
රාජකාරි :————.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| ස්ත්‍රී | | පුරුෂ - 0 |
| පුරුෂ | | ස්ත්‍රී - 1 |

3.2 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :

වර්ෂ : | | | | | මාස : | | | දින : | | |

3.4 විවාහක/අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | |
|---|---|---|
| විවාහක : | | විවාහක - 1 |
| අවිවාහක : | | අවිවාහක - 2 |

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. සම්බන්ධ කරගත හැකි දුරකතන අංක :

ජංගම : | | | | | | | | | | | ස්ථාවර : | | | | | | | | | | |

*06. අධ්‍යාපන සුදුසුකම් :*

6.1 උපාධිය පිළිබඳ විස්තරය :

| *උපාධිය* | *ආයතනය* | *සාමාර්ථය* | *විෂයයන්* | *වලංගු දිනය* |
|---|---|---|---|---|
| | | | | |

6.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය : වර්ෂය :————. මාසය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |

6.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය : වර්ෂය :————.මාසය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

07. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් :

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

08. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :————.
ගෙවූ මුදල :————.
ගෙවූ දිනය :————.
කුවිතාන්සි අංකය :————.

| කුවිතාන්සිය මෙහි අලවන්න |
|---|

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම***

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා බවත්, මුදල් ගෙවන ලදුපත අලවා ඇති බවත්, මා ඉදිරියේ දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

- අයදුම්කරුගේ අත්සන සහතික කිරීම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 10. VI ඡේදයේ සඳහන් පරිදි විය යුතුය.
- රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් පහත සඳහන් සහතිකය සමඟ සිය දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම දෙපාර්තමේන්තුවේ ................. ලෙස සේවය කරන ............................. මයා/මිය/මෙනෙවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් මුදා හැරීම කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

10-100

---

සංශෝධනයයි

**ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යටතේ වන ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) තනතුර සඳහා වන සීමිත තරඟ විභාගය - 2024

*අයදුම්පත් භාරගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම.*

අංක 2399 දරන 2024.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද උක්ත විභාගය සඳහා වූ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2024.10.25** දින දක්වා දීර්ඝ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

එසේ වූව ද, විභාග නිවේදනය මගින් අපේක්ෂිත සියලු සුදුසුකම් **2024.09.23** දිනට සපුරා තිබිය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය.

"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

10 - 148

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**
**(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)**

ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව - 2024
(ප්‍රථම කණ්ඩායම - ප්‍රධාන බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාව හරහා ළමා මනෝවිද්‍යාව සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබා ගැනීමට හෝ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව සිය උසස් අධ්‍යාපනය සඳහා හැදෑරීමට උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකිය.

*සුදුසුකම්.-* අ. පො. ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S3 සාමාර්ථය සහිතව සමත් වීම ; සහ

2024.10.05 දිනට වයස 18ට වැඩි වීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

*පාඨමාලාවේ ස්වභාවය.-* මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය).

*මාධ්‍ය.-* සිංහල හෝ ඉංග්‍රීසි

*පාඨමාලා කාලය.-* සය මාසික අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

*පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු.-* මුළු පාඨමාලා ගාස්තුව රු. 15,000.00 කි.

පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 900.00ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය. රු. 15,000.00ක මුදල එකවර හෝ රු. 2,500.00 බැගින් සය මාසිකව ගෙවිය හැකි ය.

*පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරු විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය.
2. අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායාරූපය,
3. තම වර්ණවත් පැහැදිලි ඡායාරූපය (මාර්ගගත ශිෂ්‍ය හැඳුනුම්පත සැකසීම සඳහා)

070-4191660 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවා ගන්නා අවසන් දිනය.- **2024.10.30** වේ.

*වැඩි විස්තර සඳහා.-* කාර්යාලයීය වේලාවන්වන **පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා** 032-3137500 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ලේඛකාධිකාරී,
මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

10-152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.